# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 ඔක්තෝබර් මස 28 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 15.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]

එල්.ඩී.—ඕ. 71/2021

**(70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය, "එය ලිඛිත වන්නේ නම් ද" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 70 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

"(අ) අදාළ ඔප්පුව හෝ සාධන පත්‍රය ලිඛිත වන්නේ නම් ද එකම අවස්ථාවක දී පැමිණ සිටින සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට එකී සෑම ලියා අත්සන් කරන්නකු විසින් ම අත්සන් කර ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කර ඇත්නම් ද; සහ

(ආ) එකී සෑම ලියා අත්සන් කරන්නකුගේ ම වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ එවැනි ලියා අත්සන් කරන්නකුගේ මාපට ඇඟිලි දෙකම නොමැති නම්, අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයක ඇඟිලි සලකුණ අදාළ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, දෙවන පිටපතේ සහ මූලපත්‍රයේ අත්සනට ඉහළින් හෝ ඒ අසලින් තබා ඇත්නම් මිස,

බලාත්මක නොවිය යුතු ය; හෝ නීතියෙහිලා ආධාර කර ගත නොහැකි විය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත එවැනි යම් ලියා අත්සන් කරන්නකුගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ප්‍රසිද්ධ නොතාරිස්වරයාගේ සහතිකයෙහි එකී හේතුව සඳහන් කරනු ලැබිය යුතු අතර, එකී ලියා අත්සන් කරන්නා විසින් අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.";

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත් කර ඒ වෙනුවට "(2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට යටත්ව ලියා අත්සන් කර ඇත්නම් මිස වලංගු නොවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) තෙස්තමේන්තුකරු විසින්, එකම අවස්ථාවක දී පැමිණ සිටින ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහ සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට (1) වන උපවගන්තියේ සඳහන් අන්තිම කැමති පත්‍රයේ, තෙස්තමේන්තුවේ හෝ කොඩිසිල් පත්‍රයේ පාමුල හෝ කෙළවර -

(අ) අත්සන් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඔහුගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත තෙස්තමේන්තුකරුගේ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ඔහු විසින්, අවස්ථාවෝචිත පරිදි, වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "තෙස්තමේන්තුකරුගේ හෝ තෙස්තමේන්තුකාරියගේ අත්සන" යන වචන වෙනුවට "අත්සන සහ තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන ව්‍යතිරේඛය ඇතුළත් කිරීමෙන්:-

"එසේ වුව ද, තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් යම් හේතුවක් මත ලබාගැනීමට නොහැකි වූ අවස්ථාවක දී, තෙස්තමේන්තුකරු විසින් ඔහුගේ පාදයක ඇඟිලි සලකුණ තැබිය යුතු අතර ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් එම හේතුව ඔහුගේ සහතිකයේ සටහන් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "පිටපත් දෙකකින්" යන වචන වෙනුවට "පිටපත් තුනකින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"ඔප්පු පිටපත් තුනකින් ලියා අත්සන් කළ යුතු බව".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.